# එරික් එරික්සන්ගේ ආයුකාල සංවර්ධන න්‍යායය

කළුබෝවිටියන සෝරත හිමි

## හැඳින්වීම

ජර්මනියේ ෆ්‍රැන්ක්ෆර්ට් නුවර 1992 දී උපත ලද එරික්සන්ගේ පියා පිළිබඳ තොරතුරු වාර්තා නො වන අතර සුළු පියා යටතේ සංවර්ධනය වූ මොහුට තමාගේ නම පිළිබඳ ව ද විශ්වාසයක් නොපැවතී ඇති අතර අනන්‍යතාව පිළිබඳ ගැටලුව ඔහුට මුල් අවධියේ සිට පැවතී ඇත. එරික්සන්ගේ ළමා කාලයේ සිදුවීම් අනන්‍යතා න්‍යායය ගොඩ නැංවීමට පාදක වූ බව පැහැදිලි ය. ඔහුගේ මව විවාහ වන දිනයේ උත්සවය පවත්වා පැය කිහිපයකට පසු විවාහ වුන පුද්ගලයා හැරදා ගොස් ඇත. එරික්සන්ගේ මව එරික්සන්ගේ පියා පිළිබඳ කිසිවක් කියා නොමැති අතර ඔහුගේ ආරක්ෂාව සඳහා ජර්මනියට යවන ලදි. එරික්සන් පාසල් අධ්‍යාපනයේ දී ද සමවයස් දරුවන්ගෙන් ප්‍රතික්ෂේප විය. එරික්සන් යුදෙව් පවුලකට අයත් වීම හේතු කොට ගෙන මෙම අනන්‍යතා අර්බුදයට මුහුණ දී ඇති අතර මේ සඳහා පවුල් පසුබිම හා පාසල් සමාජය ද ඍජුවම බලපා ඇත. සිග්මන් ෆ්‍රොයිඩ් සමග සමීප ව ඇසුරු කළ මොහු ෆ්‍රොයිඩ්ගෙන් ප්‍රතිකාර ගත් රෝගීන් විසින් වියානා නගරයේ ඉදි කර දුන් පාසලක සේවය කර ඇති අතර එහි දි ෆ්‍රොයිඩ්ගේ ද සහාය ඇති ව අනන්‍යතාව පිළිබඳ සංකල්පය හඳුනා ගෙන අනන්‍යතා න්‍යායය හඳුන්වා දුන්නේ ය. පසු ව කැනේඩියාවේ උපත ලැබූ ෆ්‍රොයිඩ්ගේ අනුගාමික කාන්තාවක් වූ ජෝන් සෙසෝරම් සමග විවාහ වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස එරික්සන්ගේ චිත්තවේග ස්ථාවරත්වය තහවුරු වූ අතර මෙම න්‍යායය සංවර්ධනය කිරීමට එය ආධාර විය. 1933 ඇමරිකාවට සංක්‍රමණය වූ එරික්සන් මනෝවිශ්ලේෂණවාදී ප්‍රතිකාර ක්‍රම, චර්යා ගැටලු සහිත ළමයින්ට ප්‍රායෝගික ව කරන ලදි. යේලි විශ්වවිද්‍යාලයේ වෛද්‍ය සිසුන්ට ඉගැන්වූ එරික්සන් මානව විද්‍යාඥයන් සමග පර්යේෂණ කරන ලදි. එහි දී මතු වූ සංකල්පයක් වූයේ ළමා සංවර්ධනයට සමාජ සංස්කෘතිය බලපානු ලබන බවයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස

මනෝ සමාජීය අවධි න්‍යාය හඳුන්වා දුන්නේ ය. සිග්මන් ෆ්‍රොයිඩ් විසින් ඉදිරිපත් කරන මනෝ ලිංගික සංවර්ධන අවධි න්‍යායයේ මුල් අංග හතරට ආයුකාල සංවර්ධන න්‍යායයේ මුල් අංග හතර සමාන කරන අතර ෆ්‍රොයිඩ් ඉදිරිපත් කරනු ලබන්නේ ජීවවිද්‍යාත්මක අවධි සංකල්පයක් වන අතර එරික්සන් ඉදිරිපත් කරනු ලබන්නේ මනෝ සමාජීය සාධකයකි. ඒ අනුව අවධි අටකින් යුත් මානව සංවර්ධන න්‍යායයේ සෑම අවධියක දී ම අර්බුදයක් ඇති වන අතර එයට හැඩ ගැසී සාමාන්‍ය ලෙස සංවර්ධනය වීමෙන් පුද්ගල සංවර්ධනය සිදු වන බව එරික්සන්ගේ අදහසයි.

පුද්ගලයෙකුගේ ජීවිතයේ ආරම්භයේ සිට මරණය දක්වා පරිණතිය හා අත්දැකීම් හේතු කොට ගෙන පුද්ගලයා තුළ සිදුවන ආනුක්‍රමික වෙනස්වීම් මාලාව පුද්ගල සංවර්ධනය ලෙස සැලකේ. මෙය ආයු කාල සංවර්ධනය යනුවෙන් ද හඳුන්වනු ලබයි. ආයු කාල සංවර්ධනය ළමා සංවර්ධනය හා වැඩිහිටි සංවර්ධනය යනුවෙන් ප්‍රධාන ආකාර දෙකකින් යුක්ත වේ. එම සංවර්ධන ක්‍රියාවලිය ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව සිදු වන අතර ප්‍රමාණාත්මක ව සිදුවන සංවර්ධනය වනුයේ ශරීරයේ උස, බර ශරීර ප්‍රමාණය, වාග් මාලාවේ පෝෂණය වැනි පහසුවෙන් මිනිය හැකි ලක්ෂණවල සිදුවන සංවර්ධනයයි. ගුණාත්මක සංවර්ධනය යනු මානසික ව සිදු වන වෙනස්කම් මාලාවයි. ගුණාත්මක සංවර්ධනය දෘශ්‍යමාන නොවේ.




ඒ අනුව පුද්ගලයා උපතේ සිට මරණය දක්වා විවිධ අදියරවල දී සංවර්ධනය සිදු වන ආකාරය ඉහත රූප ඉදිරිපත් කරයි. ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව සිදු වන සංවර්ධනය නැවත පුළුල් ලෙස අංශ කීපයක් යටතේ හඳුනා ගත හැකි ය. එනම්

- මොළය, සංවේදී ඉන්ද්‍රියන් හා චාලක අංශයන්ගේ සිදුවන කායික සංවර්ධනය
- ප්‍රජානන සංවර්ධනය
- පුද්ගලයෙකුගේ හැසිරීම වෙනස්වීම
- චිත්තවේග සංවර්ධනය
- සදාචාරාත්මක සංවර්ධනය
- සමාජ කුසලතා සංවර්ධනය
- මනෝ සමාජීය හෙවත් සමාජ චිත්තවේග සංවර්ධනය ආදී අංශ හඳුනාගත හැකිය.

තවදුරටත් මෙම සංවර්ධන ක්‍රියාවලිය පහත වගුවෙන් පැහැදිලි කරගත හැකිය.

| අනු අංකය | අවධිය | වයස | හැඩ ගැසීම | මූලික ශක්තිය |
|---|---|---|---|---|
| 01 | බිළිඳු අවධිය | උපතේ සිට වයස අවුරුදු 01 දක්වා | විශ්වාසයට එදිරිව අවිශ්වාසය | බලාපොරොත්තු |
| 02 | ළදරු අවධිය | වයස අවුරුදු 01 සිට 03 දක්වා | ස්වාධීනත්වයට එදිරිව ලැජ්ජාව, බිය, සැකය | කැමැත්ත |
| 03 | පෙර පාසල් අවධිය | වයස අවුරුදු 03 සිට 05 දක්වා | ආරම්භක ශක්තියට එදිරිව වරදකාරිත්වය | අරමුණු |
| 04 | මධ්‍ය ළමා අවධිය | වයස අවුරුදු 06 සිට 11 දක්වා | කඩිසර ගතියට එදිරිව හීනමානය | නිපුණතා |

| | | | | |
|---|---|---|---|---|
| 05 | නව යොවුන් අවධිය | වයස අවුරුදු 12 සිට 18 දක්වා | අනන්‍යතාවට එදිරිව ස්වකීය ක්‍රියා කලාපයේ ව්‍යාකුලත්වය | විශ්වාසවන්තභාවය |
| 06 | තරුණ වැඩිහිටි අවධිය | වයස අවුරුදු 18 සිට 35 දක්වා | මිත්‍රත්වයට කුළුපගකමට එදිරි ව තනි වීම | ආදරය |
| 07 | මධ්‍ය වැඩිහිටි අවධිය | වයස අවුරුදු 35 සිට 55 දක්වා | උත්පාදකයන්ට එදිරිව එක තැන ලැග සිටීම | රැකවරණය |
| 08 | පරිණත අවධිය | වයස අවුරුදු 55 සිට ඉදිරියට | සමෝධානයට එදිරිව නෂ්ට අපේක්ෂා | ඥානය |

**එරික් එරික්සන් හඳුන්වා දුන් ආයුකාල සංවර්ධන න්‍යායයේ මූලධර්ම**

එරික් එරික්සන් හඳුන්වා දුන් ආයුකාල මානව සංවර්ධනය පිළිබඳ න්‍යායය, ජීවිත කාලය පුරා පුද්ගල සංවර්ධනයෙහි ලා සිදුවන මනෝ සාමාජීය වර්ධන ක්‍රියාවලිය හා මනුෂ්‍යයාට එය බලපාන ආකාරය පිළිබඳ ඉදිරිපත් වූවකි. පුද්ගල සංවර්ධනය පිළිබඳ ව අදහස් දැක්වූ අනෙක් මනෝ විද්‍යාඥයින්ට අනුව ළමා සංවර්ධනය අවුරුදු 18 දී පමණ අවසන් වන නමුත් එරික්සන් ඉදිරිපත් කළ මෙම න්‍යායයේ විශේෂත්වය වන්නේ උපතේ සිට මහලු විය දක්වා සංවර්ධනය පිළිබඳ සමාජ මානසික අන්තර් ක්‍රියාකාරීත්වය අඛණ්ඩව ඉදිරිපත් කිරීමයි. එරික්සන් දක්වන ආකාරයට සංවර්ධන අවධි 08 ඔස්සේ පුද්ගලයා සංවර්ධනය වීමේ දී ඒ ඒ කාල තුළ දී ජීවිතය ගත කරන පුද්ගලයා තුළ ඇතිවිය හැකි මානසික ගැටුම නැතහොත් ප්‍රධාන වශයෙන් ඇතිවිය හැකි මානසික බලවේග මෙම න්‍යායෙන් ඉදිරිපත් කරයි.

පුද්ගලයෙකුගේ ජීවිතයට වඩාත් ම වැදගත් වන්නේ තම අනන්‍යතාව ගොඩනගා ගැනීමයි. මෙසේ පුද්ගල අනන්‍යතාව ළමා කාලයේ සිට කෙමෙන් ගොඩ නැගෙන බැවින් ළමයා විසින් අත්පත් කර ගන්නා අත්දැකීම් බෙහෙවින් වැදගත් වේ. මෙහිදී ළමයාට මුහුණ පාන්නට සිදුවන සමාජ සංස්කෘතික නොගැළපීම් හා බාධා හේතු

කොට ගෙන අනන්‍යතාව ගොඩනංවා ගැනීම පිළිබඳ අර්බුද ඇතිවිය හැකි බව ඔහු ඉදිරිපත් කරයි. මෙසේ ඇතිවිය හැකි අර්බුදකාරී තත්ත්ව පුද්ගලයෙකුගේ මුළු ජීවිත කාලය පුරාම ක්‍රියාත්මක විය හැකිය. අනන්‍යතා අර්බුදය පදනම් කරගත් එරික්සන් අවධි අටකින් සමන්විත මනෝසාමාජීය වර්ගීකරණයක් ඉදිරිපත් කරයි.




## 01. බිළිඳු අවධිය

උපතේ සිට අවුරුදු 01 දක්වා ක්‍රියාත්මක වන මෙම අවධියේ දී ළමයා තුළ විශ්වාසයට එදිරිව අවිශ්වාසය ඇති වෙයි. එමෙන් ම ෆ්‍රොයිඩ්ගේ මනෝලිංගික සංවර්ධන අවධියෙහි පළමු අවධියට සමාන බව එරික්සන් පෙන්වා දුන්නේ ය. මෙම අවධිය තුළ තම මව හෝ රැක බලා ගන්නන් කෙරෙහි පරායත්ත වේ. ඒ අනුව මෙම අවධියේ දී ළමයාගේ විශ්වාසය නම් සියල්ලන් ම තමාට ආදරේ ය, තමාට හිතවත් ය යන සිතිවිල්ලයි. එහිදී ළමයාගේ සියලු කටයුතු සිදුකළ යුතුය. යම් කටයුත්තක් සිදු කිරීමට පමා වීම හෝ එහිදී සිදුවන අඩුපාඩු හේතුවෙන් විශ්වාසය කඩ වී යැයි අවිශ්වාසය හටගනී. ඒ අනුව ළමා සංවර්ධනයේ දී බිළිඳු අවධිය තුළ ළමයාට අවශ්‍ය ආදරය රැකවරණය මූලික වශයෙන් ලබාදිය යුතු ය. එරික්සන් පෙන්වා දෙන පරිදි ළමයාගේ මුඛය මෙම අවධියේ දී ඉතා වැදගත් බව පෙන්වා දෙයි. සිය මවගෙන් කිරි උරා බීම හා ඇඟිලි ඉරීම මගින් සතුට ලබයි. ඒ අනුව ළදරුවා විශ්වාසය ගොඩ නගා ගන්නා අතර එය අනාගත

පෞරුෂ සංවර්ධනයට සෘජුව ම බලපානු ලබයි. එමෙන් ම එරික්සන් පෙන්වා දෙන පරිදි මව විසින් දරුවා ප්‍රතික්ෂේප කරයි නම් එක ම ආකාරයට දරුවාට නොසලකයි නම් එවිට දරුවා තුළ අවිශ්වාසය ගොඩනැගෙයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ළමයා තුළ සැකය, කාංසාව, බය වැනි පෞරුෂත්ව ලක්ෂණ ගොඩනැගෙයි. එමෙන් ම මවගේ රැකියා තත්ත්වය හේතු කොට ගෙන දරුවා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල (Daycare Center) වැඩි කාලයක් රැඳේ නම් අවිශ්වාසය තවදුරටත් සංවර්ධනය වේ. ඒ අනුව මෙම අවධියේ දී දරුවා රැක බලා ගන්නා ආකාරය අනුව විශ්වාසයට එදිරිව අවිශ්වාසය ගොඩ නැගෙන බවත් ඒ අනුව අදාළ පෞරුෂ ලක්ෂණ ගොඩනැගෙන බවත් එරික්සන්ගේ අදහස විය. මෙම අවධියේ විශ්වාසය බිඳ වැටීම හේතුවෙන් අනාගතයේ විවිධ පෞරුෂ ඌනතා ඇති විය හැකි බව මෙමගින් තවදුරටත් පෙන්වා දෙයි. එමෙන් ම මෙම අවධියේ දී මව දරුවා සමග හොඳ අන්තර් සම්බන්ධතාවක් පවත්වන්නේ නම් දරුවා තුළ ඉහළ විශ්වාසයක් ගොඩ නැගෙන බවත් කුඩා කාලයේ දී මව හැර යාම හෝ මවගෙන් නිසි ආදරය නොලැබීම හේතුවෙන් අනාගතයේ ආදර සබඳතා, විවාහය වැනි අසුරු සම්බන්ධතාවල දී අවිශ්වාසය පෞරුෂය තුළින් ඉස්මතු වන ආකාරය පෙන්වා දී ඇත.

උදා: නිසි ආදරය නොලැබීම ඌන පූර්ණ පෞරුෂ ලක්ෂණ ඇති වීම.



අධ්‍යාපනවිද්‍යා අධ්‍යයනඃ අධ්‍යාපන මනෝවිද්‍යාව
වෙළුම IV - කලාපය I / 2022 / ISSN 2820-2023

**02. ළදරු අවධිය**

අවුරුදු 01 සිට 03 දක්වා ක්‍රියාත්මක වන මෙම අවධියේ දී ළමයා තුළ ස්වාධීනත්වයට එදිරිව ලැජ්ජාව හා සැකය ඇතිවෙයි. මෙම අවධිය ෆ්‍රොයිඩ්ගේ ළමා සංවර්ධනයට අනුව ගුද අවධියට සමාන වේ. ඒ අනුව මෙම අවධියේ දී ළදරුවා තමන් රිසිසේ නිවසේ හැසිරීමට, බඩුමුට්ටු උපකරණ එහෙ මෙහෙ ඇද දමමින් නිදහසේ හැසිරීමට, තනිව ඇවිදීමට තනි ව යමක් පානය කිරීමට උත්සහ ගනී. දරුවාගේ සංවර්ධනයට ස්වාධීනව හැසිරීමට ඉඩ ප්‍රස්තාව සැලසීම දෙමාපියන්ගේ හා රැක බලා ගන්නන්ගේ වගකීම වේ. වැඩිහිටියන් රැක බලා ගන්නන් දරුවාගේ හැසිරීමට බාධාකර දොරටුවලට වැටවල් ගසා අවහිර කිරීම් සිදු කළ හොත් එවිට ළමයා තුළ ලැජ්ජාව, බිය, සැකය පහළ වෙයි. වැසිකිළි කැසිකිළි පුහුණුව මගිනුත් ස්වාධීනත්වය හුරු කරනු ලබයි. දරුවාගේ කැමැත්ත පරිදි ස්වාධීන ලෙස හැසිරීමට දෙවම්පියන් අනවශ්‍ය ලෙස බාධා ඇති කරන විට දරුවාට ලැජ්ජාව, බය තමා පිළිබඳ විශ්වාසය බිඳ වැටීම සිදු වේ.

උදාඃ නිදහස් හැසිරීමට බාධක යෙදීමෙන් ලැජ්ජා සහිතව බියට පත්වන පුද්ගලයෙකු නිර්මාණය වේ.



**03. පෙර පාසල් අවධිය**

අවුරුදු සිට 03 සිට 05 දක්වා ක්‍රියාත්මක වන මෙම අවධියේ දී ආරම්භක ශක්තියට එදිරිව වරදකාරිත්වය නිර්මාණය වේ. ෆ්‍රොයිඩ්ගේ ලිංගරූපික අවධියට සමාන වන මෙම අවධිය තුළ ළමයා සමාජයට හැඩ ගැසීමට මූලික පදනම ලෙස පෙර පාසලට යොමු වේ. පෙර පාසල සමවයස් ඇසුර මෙන් ම සමාජානුයෝජනයේ මූලික ස්ථානයකි. මෙම අවධියේ දී ළමයා විවිධ අත්හදා බැලීම් කරයි. එනම් දිවීම, පැනීම, විවිධ සෙල්ලම් භාණ්ඩ ඔස්සේ විවිධ උපකරණ අත්හදා බැලීම් ආදිය යි. නමුත් දෙමව්පියන් සහ වැඩිහිටියන් විසින් අනවශ්‍ය ආකාරයට වැළැක්වීම සිදු කරයි නම් එය ළමයාගේ පෞරුෂ සංවර්ධනය කෙරෙහි සෘජුව ම බලපානු ලබයි.

උදා: නව අත්හදා බැලීම් වැළැක්වීම මගින් ළමයා එය වරදක් සේ සැලකීම, සීමාවලට හිරවීම



**04. මධ්‍ය ළමා අවධිය**

අවුරුදු 06 සිට 10 දක්වා ක්‍රියාත්මක වන මෙම අවධිය ෆ්‍රොයිඩ්ගේ නිලීන අවධියට සමාන කරයි. මෙම වයසේ දරුවා පාසල් අධ්‍යාපනයට යොමුවන අතර අලුත් සමාජ බලපෑමකට ලක් වේ.

එනම් නව දේවලට නිරාවරණය වන අතර නීතිරීති අනුව සෙල්ලම් කිරීමේ හැකියාව ඇති අතර ළමයා හොඳ පුරුදු නිවසේ හා පාසලේ දී ඉගෙනගනී. සෙල්ලම් කිරීම විවිධ ක්‍රියාකාරකම්වල නිරත වීම, අත්හදා බැලීම්, දෙමව්පියන් මනාව අවබෝධ කරගෙන හැකියාවන් සංවර්ධනයට ඉඩ ප්‍රස්තා සැලසිය යුතු ය. දෙමව්පියන් හා ගුරුවරුන් දරුවන්ගේ විවිධ කුසලතා සංවර්ධනයට සහාය නොදීම, හැකියා ප්‍රතික්ෂේප කිරීම, ඒවා පාලනය කිරීම තුළින් හීනමානය නැමැති ගති ලක්ෂණ ඇති වේ. ඒ අනුව කඩිසර ගතියට එදිරිව හීනමානය පහළ වෙයි. නිපුණත්වය යනු කඩිසරභාවයේ මූලික හැකියාව වන අතර යම් නව කාර්යයක් ඇති කිරීම සඳහා පුද්ගල බුද්ධිය මෙහෙයවනු ලබයි.

උදාඃ ළමයාගේ නව අත්හදා බැලීම් පාලනය කිරීමෙන් ළමයා හීනමානය සහිත පුද්ගලයෙකු බවට පත්වෙයි.



**05. නව යොවුන් අවධිය**

අවුරුදු 10 සිට 20 දක්වා ක්‍රියාත්මක වන මෙම අවධියේ දී කායික, චිත්තවේග, ප්‍රජානන වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස නව යොවුන් වියේ පසු වන්නා තුළ විවිධ මතවාද, අත්හදා බැලීම් කරමින් යම් යම් දේ තීරණය කිරීමට උත්සාහ ගන්නා අතර එරික්සන්ට අනුව නව යොවුන්විය ළමා කාලය හා වැඩිහිටි විය අතර සංක්‍රාන්ති කාල සීමාවක් වන අතර නව යෞවනයා තමා පිළිබඳ අනන්‍යතාව තහවුරු කර ගැනීමට උත්සාහ ගනී. මෙම අනන්‍යතා සංකල්පයට දෙමව්පියන් සහ වැඩිහිටියන් බාධා ඇති කළ විට ස්වකීය ක්‍රියාකලාපය පිළිබඳ ව්‍යාකූලත්වයක් ඇතිවේ. නව යොවුන්වියේ වර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන් තමා පිළිබඳ ආත්ම සංකල්පය පහළ වන අතර ඊට බාධා

හෝ අවහිරකම් එල්ල වූ විට තමන් කළ යුතු දේ ගැන ව්‍යාකූලත්වයක් පහළ වෙයි. අනන්‍යතාව තහවුරු කර ගැනීම සඳහා ධනාත්මක සමවයස් ඇසුර ඉතා වැදගත් වේ. මෙම අවධියේ දී විශ්වාසනීයත්වය මූලිකව ම වර්ධනය වන ශක්තිය වන අතර විශ්වාසනීයත්වය නව යෞවනයාගේ අවංක  බව සහ අව්‍යාජ බව ඔහු පවත්වන අන්තර් සම්බන්ධතාවල දී පෙන්නුම් කරනු ලබයි.

උදා: ආත්ම සංකල්පයට බාධා කිරීමෙන් තමා පිළිබඳ ව්‍යාකූලත්වය ජීවිතය පුරා ඇති වේ.



**06. මුල් වැඩිහිටි අවධිය**

අවුරුදු 20 සිට 35 දක්වා ක්‍රියාත්මක වන මෙම අවධිය පෙර අවධිවලට වඩා දිගු කාලයක් ලෙස සැලකෙන අතර මෙය නව නව යොවුන් අවධියේ සිට වයස අවුරුදු 35 දක්වා කාල පරාසයක පැතිරෙන අතර මෙම අවධිය තුළ ඉහළ අධ්‍යාපනය, දෙමාපිය වගකීම් සහ වගවීම් හඳුනාගන්නා අතර වැඩහිටියෙකු ලෙස ස්වාධීනව කටයුතු කිරීමට ආරම්භ කරයි. එමෙන් ම ප්‍රේම සම්බන්ධතා, විවාහ වීම හා ලිංගික සබඳතා සමීප මිතුරන් ඇති කර ගැනීමට සිදුවේ. මෙම අවධියේ දී අන් අය පිළිබඳ ව කැප වීම, සැලකිලිමත් බව වැදගත් වේ. තරුණ වැඩිහිටි වියේ දී සමීප සබඳතා ඇතිකර ගැනීමට නොහැකි වුවහොත් හුදෙකලා වීමේ හැඟීම සමාජ සබඳතාවලින් වැළකී සිටීම අනෙකුත් පුද්ගලයන් ප්‍රතික්ෂේප කිරීම සිදු කරයි. සමහර අවස්ථාවල දී ඔවුන් කෙරෙහි ආක්‍රමණශීලී වන අතර ධනාත්මක අන්තර් සබඳතා නොමැති විට හුදෙකලා හැඟීම ඇති වේ. එරික්සන්ට අනුව මෙම අවධියේ පුද්ගලයා තනිව සිටීමට කැමැත්තක් දක්වන්නේ

සමීප සබඳතාවලට ඇති බිය නිසා ය. ආදරය මෙම අවධියේ මතුවන ප්‍රධාන ශක්තිය වන අතර සියලු මානව ගුණධර්ම අතුරින් ශ්‍රේෂ්ඨතම දේ ලෙස සලකනු ලබන්නේ ආදරය යි. තවත් පුද්ගලයෙකු සමග සම්බන්ධ වීම හවුල් අනන්‍යතාවක් මෙන් ම අන්‍යෝන්‍ය භක්තියකින් වෙනත් පුද්ගයෙකු සමග සම්බන්ධ වෙයි.

උදාඃ මිත්‍ර සම්බන්ධතා ජාලය අඩුවීමෙන් හුදෙකලා බව, තනිකම නිර්මාණය වේ.



**07. මධ්‍ය වැඩිහිටි අවධිය**

අවුරුදු 35 සිට 55 දක්වා ක්‍රියාත්මක වන මෙම අවධිය පරිණත අවධියක් ලෙස සැලකේ. ඊළග පරම්පරාවට ඉගැන්වීමට හා මග පෙන්වීමට ක්‍රියාකාරීව සම්බන්ධ වන අතර එය පවුලට හා සමාජය දෙසට යොමු වේ. එරික්සන්ගේ විග්‍රහයට අනුව සමාජ ආයතන, පාසල, ඊළග පරම්පරාව සැකසීමට උනන්දු වන වන අතර වැඩිහිටියා මෙම ආයතන හා සම්බන්ධ වෙමින් ඊළග පරම්පරාව සඳහා නිර්මාණ කරයි. පුද්ගලයාගේ උත්පාදක ශක්තිය සමාජයට මුදාහැරීම මෙම අවධියේ මූලික අවශ්‍යතාව වන අතර ඊට බාධා පැමිණෙන විට කලකිරීම හා කිසිවක් නොකර එකතැන ලැග සිටීම නමැති අර්බුදකාරී තත්ත්වයට පත්වේ. රැකබලා ගැනීම මෙම අවධියේ මූලික ලක්ෂණය වන අතර රැකවරණය යන්නෙන් අන් අය කෙරෙහි පුළුල් සැලකිල්ලක් දැක්වීම මෙමගින් අදහස් කරයි. පුද්ගලයාගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම රැකවරණ අවශ්‍යතා ඉටු කිරීමට වඩා වැදගත් තත්ත්වයකි.

උදාඃ පුද්ගල උත්පාදක ශක්තිය රටට මුදා හැරීමට අවස්ථාව නොදීමෙන් කලකිරීම හා නව නිෂ්පාදන බිහි නොවේ.



**08. පරිණත අවධිය**

අවුරුදු 55 සිට ඉදිරියට ක්‍රියාත්මක වන මෙම අවධිය ආයුකාල සංවර්ධනයේ අවසාන අදියර යි. පුද්ගලයාගේ ජීවිතයේ ජයග්‍රහණ සහ සාර්ථක අසාර්ථක තත්ත්ව මෙනෙහි කරන අතර අතීතය පිළිගැනීම ද සිදු කරයි. පුද්ගල ජීවිතය කනගාටුවෙන් හා කලකිරීමෙන් ගතවූයේ නම් නිවැරදි කළ නොහැකි බලාපොරොත්තු සුන්වීමක් දක්නට ලැබේ. එනම් සමෝධානයට එදිරිව නෂ්ට අපේක්ෂා ඇති වේ. මහලු වියට පත් වීමේ දී තමා ඉටු කළ මෙහෙවර සමෝධානය කරමින් තෘප්තිමත් වේ. මෙනෙහි කිරීමට යම් දෙයක් නැතිනම් අපේක්ෂාවන් නෂ්ට බලාපොරොත්තු විරහිත බවට පත්වේ.

ප්‍රඥාව මුල් කර ගත් මෙම අවසාන අවධියේ මූලික ලක්‍ෂණය ප්‍රඥාව වන අතර ඊළග පරම්පරාවට අත්දැකීම් සම්ප්‍රේෂණය කරයි. එනම් තම අත්දැකීම් බෙදා හදාගනියි.

උදා: ජීවිතය තුළ යම් මෙහෙවරක් සිදු නොකිරීමෙන් බලාපොරාත්තු විරහිත තත්වයට පත්වෙයි.



## ප්‍රබලතා හා විවේචන

එරික්සන්ගේ න්‍යායයේ ද සීමා ඇති අතර ඒ සම්බන්ධව විවිධ විවේචන ද එල්ල වී ඇත. එක් එක් අදියර සාර්ථකව නිම කිරීමට අවශ්‍ය කුමන ආකාරයේ අත්දැකීම් ද? පුද්ගලයෙකු එක් අදියරක සිට ඊළඟ අදියර දක්වා ගමන් කරන්නේ කෙසේ ද? යන්න එවැනි විවේචනයන් ය. මනෝ සමාජීය න්‍යායයේ එක් ප්‍රධාන දුර්වලතාවක් වන්නේ ගැටුම් නිරාකරණය කර එක් අදියරක සිට තවත් අදියරකට ගමන් කිරීම සඳහා වන නිශ්චිත යාන්ත්‍රණයක් හොඳින් විස්තර කර හෝ වර්ධනය වී නොමැති වීමයි. ගැටුම් සාර්ථක ව නිරාකරණය කර ඊළඟ අදියර කරා යාමට එක් එක් අදියරේ දී කුමන ආකාරයේ අත්දැකීම් අවශ්‍යදැ'යි නිශ්චිතව විස්තර කිරීමට න්‍යායය අසමත් වේ.

මනෝ සමාජීය න්‍යායයේ එක් ප්‍රබලතාවක් නම් එය මුළු ජීවිත කාලය පුරාවට ම සංවර්ධනය සඳහා පුළුල් රාමුවක් සැපයීමයි. මිනිසුන්ගේ සමාජ ස්වභාවය සහ සමාජ සම්බන්ධතා සංවර්ධනය කෙරෙහි ඇති බලපෑම අවධාරණය කිරීමට ද එය අපට ඉඩ සලසයි. පර්යේෂකයන් විසින් අනන්‍යතාව පිළිබඳ එරික්සන්ගේ අදහස්වලට සහාය වන සාක්ෂි සොයා ගෙන ඇති අතර අනන්‍යතාව ගොඩ නැගීමේ විවිධ උප අදියර තවදුරටත් හඳුනා ගෙන ඇත. සමහර පර්යේෂණයන් යෝජනා කරන්නේ නව යොවුන්වියේ දී ශක්තිමත් පුද්ගලික අනන්‍යතා ඇති කරන පුද්ගලයින්ට මුල් වැඩිහිටි අවධියේ දී සමීප සබඳතා ඇතිකර ගැනීමට වඩා හොඳ හැකියාවක් ඇති බවයි. කෙසේ වෙතත්, වෙනත් පර්යේෂණ යෝජනා කරන්නේ අනන්‍යතාව ගොඩ නැගීම සහ සංවර්ධනය වැඩිහිටි විය දක්වා ම අඛණ්ඩව සිදු වන්නක් බවයි.

මනෝ සමාජීය අවධීන් පෞරුෂ වර්ධනයේ එක් න්‍යායයක් පමණක් බව මතක තබා ගැනීම වැදගත් ය. සමහර පර්යේෂණ මෙම න්‍යායික රාමුවේ ඇතැම් අංශවලට සහාය විය හැකි නමුත්, න්‍යායයේ සෑම අංශයක් ම සාක්ෂි මගින් සහාය දක්වන බව ඉන් අදහස් නොවේ. කෙසේ වෙතත්, න්‍යායය මිනිසුන්ට ජීවිතය ගත කිරීමේ දී මුහුණ දිය හැකි විවිධ ගැටුම් සහ අභියෝග ගැන සිතීමට උපකාරී ක්‍රමයක් විය හැකි ය. එරික්සන්ගේ න්‍යායයේ එක් එක් අදියර දෙස බැලීම සහ එය ජීවිතයට අදාළ වන්නේ කෙසේ දැ'යි සලකා බැලීම ද පහසු ය. එක්

එක් අදියර ගැන ඉගෙන ගැනීමෙන් වයසට යන විට ඔබට මුහුණ දිය හැකි දේ පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි ය. එය ඔබට අතීතයේ සිදු වූ දේවල් ගැන මෙනෙහි කිරීමට සහ අද අභියෝග සමග වඩා හොඳින් කටයුතු කිරීමට ඔබේ මුහුණ දීමේ කුසලතා වැඩි දියුණු කළ හැකි ආකාරය බැලීමට උපකාර කළ හැකි ය. මෙම න්‍යායය පිළිබඳ එල්ල වන පොදු අභියෝග ලෙස,

- අදියර අනුක්‍රමික හෝ විස්තර කර ඇති අනුපිළිවෙළට ක්‍රීඩා නො කළ හැකි ය.
- එක් එක් අදියර සඳහා වයස් පරාසය නිවැරදි නොවිය හැකි ය.
- අට වන අදියර ක්‍රියාකාරකමේ සිට නිෂ්ක්‍රීයත්වය දක්වා ගමන් කිරීමක් යෝජනා කරයි, නමුත් බොහෝ අය ඔවුන්ගේ පසුකාලීන ව ප්‍රජාවේ ඉහළ ඵලදායි, ක්‍රියාකාරී සාමාජිකයින් වේ.
- නව යොවුන් වියේ දී පමණක් නො ව අපගේ ජීවිත කාලය පුරා ම අනන්‍යතාව සෙවීම බොහෝ වාරයක් සිදු විය හැකි ය.
- එක් එක් අදියරවල සංවර්ධන ක්‍රියාවලි අපැහැදිලි ය.
- පුද්ගලයා ගැටුම් නිරාකරණය කර ඊළඟ අදියර කරා යන්නේ කෙසේ ද? තනි, විශ්වීය යාන්ත්‍රණයක් විය නො හැකි බව පෙනේ.
- සැබැවට ම සාර්ථකත්වය නිර්වචනය කරන්නේ කෙසේ ද? ඇත්ත වශයෙන් ම, සමතුලිතතාව පිළිබඳ අදහස පුද්ගලයන්, සංස්කෘතීන් සහ කාලයත් සමග අප තුළ ම වෙනස් වේ.
- ජීවිතයේ පසුකාලීන ව එවැනි ගැටුම් විසඳා ගන්නේ කෙසේ ද?

එරික්සන් විසින් ම ඉහත කරුණු සමහරක් පිළිගනී. ඔහු යෝජනා කරන්නේ න්‍යායය මනෝ සමාජීය සංවර්ධනය පිළිබඳ විස්තරාත්මක දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කරන අතර ඊට සම්බන්ධ

සවිස්තරාත්මක යාන්ත්‍රණ හෝ පියවර නිර්වචනය කිරීමට උත්සාහ නො කරන බවයි.

**සමාලෝචනය**

සෑම සංවර්ධන ආයු කාලයකට ම පුද්ගලයා කිසියම් මානසික අරගලයකට මුහුණ පායි. එහෙත් එම අර්බුදයෙන් පුද්ගලයා ආතතියට පත් කරවන හෝ පෞරුෂයට හානි කරවන්නක් නො ව ඊළඟට එළඹෙන්නා වූ අලුත් වර්ධන අවධිය කරා යාමට පහසු කරවන්නකි. එක් එක් අවධිය තුළ ඇති විය හැකි නිශේධන තත්ත්ව ජය ගැනීමකි. එක් එක් අවධියේ දී එල්ල වන මානසික අර්බුදයට මුහුණ දී ජය ගැනීමෙන් ඊළඟ අවධියට පරිවර්තනය වීම පහසු කරවයි. එනම් ඒ අවධියේ දී මුහුණ දෙන ගැටලු විසඳුම් දැකීම තුළින් ඊට ඉහළින් වූ ඉහළ මට්ටමට පිය පියවර තැබීමේ ආත්ම විශ්වාසය පහළ වනු ඇත. මෙම වර්ගීකරණ න්‍යායයේ සමස්ත අර්ථය නම් පුද්ගලයා ස්වකීය අනන්‍යතාව ගොඩ නගා ගැනීමේ ක්‍රියාවලිය යි. එය පෞරුෂ වර්ධනයට ඉවහල් වෙයි. එසේ නොවුණ හොත් පෞරුෂ අපගමනය හෙවත් ඌන වර්ධිත පෞරුෂයට පුද්ගලයා යොමු කරනු ලබන්නේ මෙම ක්‍රියාවලියෙනි. ඒ නිසා මෙම අවධියට බාධා හා අවහිරතා පමුණුවාලීමෙන් තොර ව පවත්වා ගැනීමේ අවශ්‍යතාව මෙහි ලා පෙන්වා දිය හැකි ය. ඒ අනුව පුද්ගලයා තුළ අනාගත කාලයේ අන්‍යයන් කෙරෙහි විශ්වාසය තැබීමේ අඩිතාලම ප්‍රථම අවුරුද්දයි. ඒ සඳහා කුඩා කාලයේ දී නිසි ආදරය, රැකවරණය ලබා දීම, විශ්වාසය ඇති වන ආකාරයට කටයුතු කිරීම අනාගතය පිළිබඳ සුබදායි ආකල්පයක් ඇති කර ගැනීමට හේතු වෙයි. මේ අවධියේ දී භංගත්වයට පත්වන දරුවන් අනාගතයේ දී බිය අධික සැක සහිත තත්ත්වයන්ගෙන් පෙළේ. දරුවන්ගේ කායික වර්ධනය සීඝ්‍රයෙන් සිදු වීමත් සමග බාහිර පරිසරය සමග ගනුදෙනු වැඩිවේ. එමෙන් ම චාලක ක්‍රියාවල ද විශාල වර්ධනයක් සිදු වේ. ඒ අනුව මෙම ආයුකාල මානව සංවර්ධන න්‍යායය ඒ ඒ පුද්ගලයාගේ සංවර්ධනය කෙරෙහි සෘජු ව ම බලපාන බව මේ සියලු කරුණු අනුව සාධාරණීකරණය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අබේපාල, ආර්. (2010). *අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම*. කොළඹ: සාර ප්‍රකාශන.

සෙනරත්, එස් (2021). *පෞරුෂ සංවර්ධනය පිළිබඳ මනෝවිද්‍යාත්මක විග්‍රහයක්*. බත්තරමුල්ල: සමීර ප්‍රකාශන.

හෙට්ටිආරච්චි, කේ. (1999). *අධ්‍යාපන සංවර්ධනය*. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

Bee, H. L. (1992). *The developing child*. London: Harper Collins.

Erikson, E. H. (1963). *Youth: Change and challenge*. New York: Basic books

Erikson, E. H. (1968). *Identity: Youth and crisis*. New York: Norton.

Erikson E. H . (1982). *The life cycle completed*. New York: W.W. Norton & Company.

Erikson, E. H. (1959). *Psychological issues*. New York, NY: International University Press

Freud, S. (1923). *The ego and the id*. SE, 19: 1-66.

Gross, R. D., & Humphreys, P. (1992). *Psychology: The science of mind and behavior*. London: Hodder & Stoughton.

Sakaki, M., Yagi, A., & Murayama, K. (2018). *Curiosity in old age: A possible key to achieving adaptive aging*. Neuroscience & Biobehavioral Reviews, 88.

Suzanne, B. M. (2019). https://dept.clcillinois.edu/. Retrieved from https://dept.clcillinois.edu/psy/LifespanDevelopment.pdf: